# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 364 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 01/03/2024 පැය 0800

## මාධ්‍ය නිවේදනය

**01. යතුරුපැදි සොරකමකට අවශ්‍ය කර සිටි සැකකරුවන් පස් දෙනෙකු හා ව්‍යාජ අංක තහඩු සහ අංක තහඩු නොමැති යතුරුපැදි සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - අත්තනගල්ල පොලිස් ස්ථානය.**

අත්තනගල්ල පොලිස් වසමේ බෝපැත්ත ප්‍රදේශයේදී රුපියල් 525,000/=ක යතුරුපැදියක් සොරකම් කිරීම සම්බන්ධයෙන් 2024.01.31 වන දින අත්තනගල්ල පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර සොරකමට සම්බන්ධ සැකකරුවන් පස් දෙනෙකු 2024.02.29 වන දින සොරකම් කරන ලද යතුරුපැදියද සමග අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 19,21,22, 27, හා 42 වයස් වල පසුවන බළල්ල, වැල්ලව, කුලියාපිටිය හා රාගම යන ප්‍රදේශ වල පදිංචිකරුවන් වේ.**

සැකකරුවන්ගෙන් සිදුකරන ලද වැඩිදුර ප්‍රශ්ණ කිරීමේදී ව්‍යාජ අංක තහඩු සහ අංක තහඩු නොමැති යතුරුපැදි සන්තකයේ තබා ගෙන සිටි තවත් සැකකරුවන් තිදෙනෙකු යතුරුපැදියක් හා ගලවන ලද යතුරුපැදි 02ක කොටස් සමග අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 21,22 හා 27 වයස් වල පසුවන ගණේමුල්ල,වැලිවේරිය හා මණ්ඩාවල යන ප්‍රදේශ වල පදිංචිකරුවන් වේ.**

අත්තනගල්ල පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. සැකකරුවන් පස් දෙනෙකු අත්අඩංගුවට - අලවතුගොඩ පොලිස් ස්ථානය.**

2024.02.29 වන දින අලවතුගොඩ පොලිස් වසමේ අකුරණ නගරයේදී පුද්ගලයෙකු පැහැරගෙන යාමක් සම්බන්ධයෙන් අලවතුගොඩ පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් සම්බන්ධයෙන් විමර්ශන සිදුකර 2024.02.29 වන දින රාත්‍රී කාලයේ අකුරණ ප්‍රදේශයේදී පැහැරගෙන ගොස් අයුතු ලෙස සිරකර පහරදී තුවාල සිදුකර රුපියල් ලක්ෂ

විස්සක් බලෙන් ලබා ගැනීම හා අනුබල දීම සම්බන්ධයෙන් සැකකරුවන් පස් දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 22, 31, 40 හා 62 වයස් වල පසුවන අකුරණ ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

පැහැරගැනිමට ලක්වූ පුද්ගලයා වසරක පමණ සිට කොළඹ කොච්චිකඩේ ප්‍රදේශයේ වෙළඳසැලක සේවය කරනු ලබන අයෙකු බවත්, එම වෙළඳසැලේ සිදුවූ රුපියල් ලක්ෂ 20 ක මුදල් සොරකමක් සම්බන්ධයෙන් සැකයක් මත වෙළඳසැලේ හිමිකරු ඇතුළු පිරිසක් විසින් මෙම පැහැර ගැනීම සිදුකර ඇති බවට දැනට සිදුකරන ලද විමර්ශන වලදී අනාවරණය වි ඇත. මෙම පැහැර ගැනිමට ලක්වූ පුද්ගලයා සැකකරුවන්ට අයත් නිවසක සිරකර තබාගෙන සිටියදී සොයාගෙන ඇති අතර ඔහු මේවන විට අකුරණ රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබයි. තවද සැකරුවන් විසින් බලෙන් රැගෙන ගොස් තිබූ පැමිණිළිකරුට අයත් ත්‍රී රෝද රථයක් හා එහි ලියකියවිලි පොලිස් භාරයට ගෙන ඇත.

අලවතුගොඩ පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - දෙමටගොඩ පොලිස් ස්ථානය.

2024.02.29 වන දින සවස් කාලයේ දෙමටගොඩ පොලිස් වසමේ ඉංගම් හන්දිය අසලදී දෙමටගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් මාර්ග බාධක රාජකාරියේ යෙදී සිටියදී හෙරොයින් ග්‍රෑම් 410 ක් යතුරුපැදියකින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු යතුරුපැදිය සමග අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40ක් වන කැලණිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

අත්අඩංගුවට ගත් සැකකරු සම්බන්ධයෙන් සිදුකල වැඩිදුර විමර්ශනයේදී දැනට විදෙස් ගතව සිට මෙරට මත්ද්‍රව්‍ය ජාලය මෙහෙයවන සංවිධානාත්මක අපරාධකරුවෙකුගේ ගෝලයෙකු බවට අනාවරණය වී ඇත.

දෙමටගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. මෙරට නිෂ්පාදිත ගිනි අවි 02ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුර කහවත්ත.

2024.02.29 වන දින සවස් කාලයේදී කහවත්ත පොලිස් වසමේ උඩහවුපේ ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවි 02ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන කහවත්ත පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 28 හා 37 වයස්වල පසුවන තැන්නපිට ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.

කහවත්ත  පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**